# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.07.06 පැය 1805 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 1347/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**මනුෂ්‍ය ඝාතන ඇතුළු අපරාධ රැසකට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව.**

අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවේ මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමශර්න ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2005 සිට 2008 දක්වා වෂර්වල නැගෙනහිර පළාතේ සිදුවූ මනුෂ්‍ය ඝාතන, පුද්ගලයින් පැහැරගැනීම, අතුරුදහන් කිරීම්, ගිනි අවි පරිහරණය, වදකාගාර පවත්වාගෙන යාම හා කප්පම් ලබා ගැනීම් සම්බන්ධව දීඝර් විමශර්නයක් සිදු කරන ලදී.

විමශර්නවලදී අනාවරණය වූ කරුණු මත එම කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ඉහත අපරාධවලට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු 2025.07.06 වන අද දින තිරුක්කෝවිල් හා සන්දිවෙලි ප්‍රදේශවලදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 45 සහ 44 වයස්වල පසුවන තිරුක්කෝවිල් හා සන්දිවෙලි ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

එම සැකකරුවන් සම්බන්ධව සිදුකළ විමශර්නයේදී පළමු සැකකරු 2004 වෂර්යේ එල්.ටී.ටී.ඊ සංවිධානයෙන් ඉවත්වූ කරුණාම්මාන් පාශර්වයේ තිරුක්කෝවිල් ප්‍රදේශයේ සන්නද්ධ කඳවුරක ප්‍රධානියා ලෙස කටයුතු කර ඇති අතර මොහු කරුණාම්මාන් නියෝජනය කළ දේශපාලන පක්ෂයෙහි 2007 හා 2008 වෂර්වල අම්පාර දිස්ත්‍රික් ජනාධිපති සම්බන්ධීකරණ නිලධාරියා ලෙස කටයුතු කර ඇති අතර, තවද 2012 සිට 2015 දක්වා කාලයේ එම පාශර්වය නියෝජනය කළ පක්ෂයෙහි නැගෙනහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙසත් කටයුතු කර ඇති බවට අනාවරණය වී ඇත.

දෙවන සැකකරු ඉහත පළමු සැකකරුගේ අනුගාමිකයෙකු ලෙස කටයුතු කර ඇති අතර මොවුන් දෙදෙනාම අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තු අත්අඩංගුවේ රැඳවුම් නියෝග මත සිටින සිවනේසතුරෙ චන්ද්‍රකාන්තන් නොහොත් පිල්ලෙයාන් යන අයගේ නායකත්වය යටතේ නැගෙනහිර පළාත මූලික කරගෙන අපරාධ සිදුකර ඇති බවට ද අනාවරණය වී ඇත.

මෙම සැකකරුවන් සම්බන්ධ සහ ආධාර අනුබල දී ඇති බවට විමශර්නවලදි අනාවරණය වූ අපරාධ සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.

- 2005.02.07 වන දින පොළොන්නරුව, වැලිකන්ද පුල්ලෙයාඅර්ඩි ප්‍රදේශයේදී ටී.එන්.ඒ පක්ෂයේ පාලර්මේන්තු මන්ත්‍රී අරියනායගම් චන්ද්‍රනේරු ඇතුළු පුද්ගලයින් 06 දෙනෙකු ඝාතනය කිරීම.
- 2007.05.09 වන දින ජොන්සන් ජෙයකාන්තන් නොහොත් සින්දුජන් යන අය ඝාතනය කිරීම.
- 2007.06.28 වන දින තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභා සභාපති පිල්ලනායගම් උදයකුමාර් යන අය ඝාතනය කිරීම.
- 2007.07.27 තිරුක්කෝවිල් ප්‍රදේශයේ පදිංචි සිවනාදිගන් අලගුරාසා යන අය පැහැර ගැනීම.
- 2008.04.20 කල්මුණේ පොලිස් වසමේ පාණ්ඩිරිප්පු ප්‍රදේශයේදී කන්දයියා නාගරාසා සහ කනගරත්නම් ආනන්දි යන ග්‍රාම නිලධාරී යුවළ ඝාතනය කිරීම.
- 2008.09.25 වන දින තිරුක්කෝවිල් විනයාගපුරම් ප්‍රදේශයේ පදිංචි තිරුමාල් තිරුවෙල්වම් යන අය පැහැර ගෙන ගොස් ඝාතනය කිරීම.

- 2008.11.21 වන දින තිරුක්කෝවිල් විනායාගපුරම් ප්‍රදේශයේ පදිංචි රාසයියා කෝපුලන් යන අය වෙඩි තබා ඝාතනය කිරීම හා ඔහුගේ මවට වෙඩි තබා තුවාල සිදු කිරීම.

මෙම සැකකරුවන් විසින් 2022.12.21 වන දින අක්කරපත්තු අධිකරණයට ගිනි තබා අනර්ථය සිදු කිරීමේ සිද්ධියට මෙම සැකකරුවන්ගේ සෘජු සම්බන්ධතාවයක් ඇත් ද යන්න පිළිබඳ විමර්ශන කටයුතු සිදු කරනු ලබයි.

ඉහත පළමු සැකකරු සම්බන්ධයෙන් උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් වාතර්‍ා වලට අනුව නැගෙනහිර පළාතේ පුද්ගල ඝාතන, පැහැරගැනීම්, වදකාගාර පවත්වාගෙන යාම, ගිනි අවි පරිහරණය කිරීමට සම්බන්ධ පුද්ගලයෙකු ලෙස ද නම් කර ඇති බවට අනාවරණ වී ඇත.

මෙම සැකකරුවන් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව මඟින් තවදුරටත් විමශර්න සිදුකරගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**